අලව්ව ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය
--------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 ජුලි 27 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට අලව්ව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට ජුනි දක්වා වූ මාස 06 සඳහා මුද්දර ගාස්තු ලෙස රු.5,702,994 ක් ලැබී තිබුණු නමුත් ආදායම් හා වියදම් ගිණුමට ගෙන තිබුණේ රු.1,543,964 ක් පමණි. ඒ අනුව රු.4,159,030 ක් අඩුවෙන් ගිණුම්ගතව පැවතුණි. එසේම 2014 ඉදිරි මාස 06 සඳහා මුද්දර ගාස්තු උපචිත පදනමට ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂයට අදාල ගිණුම් විෂයයන් 02 කට අදාලව ගිණුම සහ අදාල උපයෝගී ලේඛණ අතර රු .470,875ක නොසැසඳීම් පැවතුණි.

1.3.3 ලැබිය යුතු ගිණුම් හා ගෙවිය යුතු ගිණුම්

(අ) 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 25,999,408 ක් විය. ඉන් දළ වශයෙන් සියයට 19 ක් ලෙස රු.1,383,883 ක් වසර 3 කට වැඩි කාලයක සිට පැවත එන ශේෂයන් වේ.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.26,281,242 ක් විය. ඉන් දළ වශයෙන් සියයට 5 ක් ලෙස රු. 1,221,324 ක් වසර 3 කට වැඩි කාලයක සිට පැවත එන තැන්පතු ශේෂයන් වේ.

02 <u>මූල්‍ය සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.80,822 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,473,513 ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,554,335 ක පිරිහීමක් පැවතුණි. මෙහි මූල්‍ය ප්‍රතිඵලයට රු.16,446,372 ක් වූ ප්‍රාග්ධන ආධාර හා රු.18,730,532ක් වූ ප්‍රාග්ධන වැය ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රතිඵලය රු.2,364,982 ක ඌනතාවයක් බවට පත්ව ඇත.

2.2 <u>විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය</u>

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.47,609,538 න් දළ වශයෙන් සියයට 74 ක් ලෙස රු.35,303,820 ක්ම සභාවේ උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම්වලින් සමන්විත විය.

(ආ) ප්‍රාග්ධන ආදායම වූ රු.16,446,372 ක මුළු ප්‍රමාණයම ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභවයන් මත වෙනත් ආයතන මගින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලබා දී ඇති මුදල්වලින් සමන්විත විය.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල මුළු පුනරාවර්තන වියදම වූ රු.47,690,360 න් දළ වශයෙන් සියයට 74 ක් ලෙස රු.35,435,674 ක් පෞද්ගලික පඩිනඩි සඳහා වියදම වූ අතර ඉන් දළ වශයෙන් සියයට 89 ක් ලෙස රු.27,977,330ක් වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන කොමසාරිස් වෙතින් ලැබී ආදායම් අධාර යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඈ) ප්‍රාග්ධන වියදම වූ රු.18,730,532 න් දළ වශයෙන් සියයට 37 ක් ලෙස රු.6,882,510 ක් පමණක් සභා අරමුදලින් වැය වී තිබූ අතර දළ වශයෙන් ඉතිරි සියයට 63 ක් වූ රු.11,848,022 ක ප්‍රමාණය ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභව මත වෙනත් ආයතනවල ප්‍රතිපාදනවලින් ඉටුකල සංවර්ධන කාර්යයන්ගෙන් සමන්විත විය.

2.3 <u>ආදායම් පරිපාලනය</u>

<u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ ප්‍රමාණය රු.2,280,587 ක්ද මුද්දර ගාස්තු ප්‍රමාණය රු.1,383,883 ක්ද විය.

## 03. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

### 3.1 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

නාරම්මල ප්‍රාදේශීය සභාව 2011 අප්‍රේල් 01 දින විභජනය කර නාරම්මල ප්‍රාදේශීය සභාව හා අලව්ව ප්‍රාදේශීය සභාව ලෙස වෙන් කිරීමේදී අලව්ව ප්‍රාදේශීය සභාවේ ජංගම ගිණුම් 3 ක් යටතේ සත්‍ය ශේෂයන් හා විභජනය කරන ලද ශේෂ පත්‍රයේ ජංගම ගිණුම් ශේෂයන් අතර රු.1,621,055 ක නොසැසඳීම් පැවතුණි.

### 3.2 <u>නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්</u>

සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් යටතේ රු.1,589,178 ක් වටිනා නිෂ්ක්‍රීය වත්කම් විෂයයන් 05 ක් දක්වා තිබුණි.

## 04. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය